# තිසර හිමරංග එදිරිතිලක එ. දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 1652/2019 (2020.08.25 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී.ජී.එම්.වී . හපුආරච්චි

**අභියාචක** - තිසර හිමරංග එදිරිතිලක
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරියා, දුම්කොළ හා මධ්‍යසාර පිළිබද ජාතික අධිකාරිය

**පෙනීසිටීම**

අභියාචක - පැමිණ නැත.
පොදු අධිකාරිය - ආචාර්ය සමාධි රාජපක්ෂ , සභාපති

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.01.04 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | පිළිතුරක් නැත. |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.04.23 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | පිළිතුරක් නැත. |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.06.06 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු**:

අභියාචක විසින් 2018.01.04 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

*ගරු මුදල් අමාත්‍යවරයා 2018 නොවැම්බර් 9 වන දින සිය අයවැය කථාවේදී සඳහන් කළේ සිගරට් සහ සිගරට් ආනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමෙන් ඉහළ නැංවෙන සිගරට් ජාවාරම සඳහා විසඳුමක් වන බවත් බියර් මිල අඩු කරන බවත්ය. (The Honourable Finance Minister in his budget speech 2018 on 9th November 2017 stated that licenses for importing of cigarettes and cigars into Sri Lanka would be issued to address the increase in smuggling of cigarettes and also that prices of beer would be reduced.)*

1. *සිගරට් සහ සුරුට්ටු ආනයන බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔබේ අධිකාරිය ගෙන ඇති පියවර / පියවර මොනවාද? (What are the measures/steps taken by your Authority over issuing of cigarette and cigar import licenses?)*
2. *බියර් මිල අඩු කිරීම සම්බන්ධයෙන් ඔබේ අධිකාරිය ගෙන ඇති පියවර / පියවර මොනවාද? (What are the measures/steps taken by your Authority over the reduction of beer prices?)*

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.04.23 දිනැතිව නම්කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරියා ද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.06.06 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

පොදු අධිකාරිය 2020.08.21 දිනැති ලිපියෙන් තොරතුරු ඉල්ලීම සම්බන්ධෙයන් පහත කරුණු දැක්විය .

1. අයිතම අංක 1- අදාල නොවේ
2. අයිතම අංක 2 - අදාල නොවේ

ඉල්ලනු ලැබූ තොරතුරු වලට ප්‍රවේශය ප්‍රතික්ෂේප කරන ලද පදනම පිළිබඳව කොමිෂන් සභාව විමසීමේදී, පොදු අධිකාරිය පවසා සිටියේ උක්ත තොරතුරු ඉල්ලීමට අදාලව විෂය පථය සම්බන්ධයෙන් කටයුතු සිදු කරනු ලබන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් බවය.

**නියෝගය:**

දුම්කොළ හා මධ්‍යසාර පිළිබද ජාතික අධිකාරිය යනු 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ඇති පොදු අධිකාරියකි. එම නිසා එහි විධිවිධාන අනුව කටයුතු කිරීමට එයට ව්‍යවස්ථාපිත වගකීමක් ඇත.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ 3 (1) වගන්තිය මෙසේය,

මේ පනතේ 5 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව, පොදු අධිකාරියක සන්තකයේ , භාරයේ හෝ පාලනයේ ඇති තොරතුරුවලට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම සෑම පුරවැසියකුටම තිබිය යුතුය.

ඒ අනුව,පොදු අධිකාරිය වෙතින් තොරතුරු ලබා ගැනීම සඳහා පුරවැසියාගේ අයිතිය පැන නගිනුයේ ඉල්ලා සිටින ලද තොරතුරු පොදු අධිකාරිය සන්තකයේ , භාරයේ හෝ පාලනයේ ඇති විටදී ය. ඉහත සඳහන් තත්වයන් තුල, අභියාචක විසින් ඉල්ලා සිටින තොරතුරු අදාළ පොදු අධිකාරිය සතුව හෝ භාරයේ හෝ පාලනයේ නොමැති බැවින් මෙම තොරතුරු අභියාචක වෙත ලබා දීමට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ පොදු අධිකාරිය බැදී නොමැත. එබැවින් කොමිෂන් සභාව විසින් පොදු අධිකාරිය විසින් ලබාදී ඇති තීරණය ස්ථිර කර සිටිමු.

පොදු අධිකාරිය, 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබද පනතේ *2* වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 41 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017.02.03 දිනැතිව ගැසට් අංක 2004/66 හි ප්‍රකාශයට පත් කර ඇති, නියෝග අංක 4 (vi) ප්‍රකාරව ඉල්ලා සිටින තොරතුරු වෙනත් ආයතනයක් සතුව ඇති බව තොරතුරු නිලධාරියා දන්නේ නම් අයදුම්පත එකී තොරතුරු තබාගෙන ඇති පොදු අධිකාරියේ තොරතුරු නිලධාරියා වෙත යවා ඒ බව අයදුම්කරුට ලිඛිතව දින 07ක් තුළ දන්වා යැවිය යුතු' බව පොදු අධිකාරියට නියෝග කරනු ලැබේ.

අභියාචනය අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.
****